විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No.: වි.වැ චක්‍රලේඛ / 2007

ඔබේ අංකය / உமது இல. / Your No.:

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2007- 08- 13

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10 / 2007.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
පලාත් පාලන ආයතන ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>විශ්‍රාම වැටුප් ප්‍රදානය සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම</u>

මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2006 සහ 15/ 2006 (1) කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගෙවීම ප්‍රමාද වන බව කණගාටුවෙන් දැනුම් දෙමි. මේ වනවිටත් විශ්‍රාම වැටුප් පාරිතෝෂික අයදුම්පත් 3700 ක පමණ ප්‍රමාණයක් ගෙවීම් කරගත නොහැකිව එකතුව ඇති බැවින් පහත පරිදි කටයුතු කිරීමට මෙම දෙපාර්තමේන්තුව තීරණය කොට ගෙන ඇත.

1) භාණ්ඩාගාරය වෙතින් මුදල් ලැබීම් පදනම් කොට ගෙන දැනට එකතු වී ඇති අයදුම්පත් සඳහා අනුපිළිවෙලින් පාරිතෝෂික ගෙවීමට චෙක්පත් නිකුත් කිරීම

2) 2007- 08- 10 දින සිට ලැබෙන අයදුම්පත් ලේඛනගත කරමින් එම අනුපිළිවෙල මත පමණක් පාරිතෝෂික චෙක්පත් නිකුත් කෙරේ.
මෙහිදී අනුපිළිවෙල ලෙස අදහස් කරන්නේ විශ්‍රාම වැටුප් අංකයක් නිකුත් කළ පසු ගිණුම් අංශයට යොමු කරන අනුපිළිවෙල වේ.

3) මරණ පාරිතෝෂික ගෙවීම හා වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීම පමණක් මෙම අනුපිළිවෙල නොසලකා කටයුතු කෙරේ.

විශ්‍රාම පාරිතෝෂික ලබා ගැනීම සඳහා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සහ පාරිතෝෂික චෙක්පත් ලබා ගැනීමේදී පහත සඳහන් කරුණු අනුව කටයුතු කළ යුතු බවද කාරුණිකව දන්වමි.

1) අදාල අයදුම්පත් නිලධාරියා විශ්‍රාමයාමට පෙර මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම (මෙම අයදුම්පත් විශ්‍රාමයාමට නියමිත දිනයට මාස තුනකට පෙර ඉදිරිපත් කළ යුතු බවට මේ වනවිටත් උපදෙස් ලබාදී ඇත)

2) විශ්‍රාම වැටුප් අංකය ලැබුණු වහාම ප්‍රදාන පත්‍රය නිකුත් කර විශ්‍රාම වැටුප් ලිපිගොනුව ප්‍රාදේශීය ලේකම් වෙත කඩිනමින් යැවිය යුතුය.

3) පාරිතෝෂික චෙක්පත ලැබුණු වහාම පාරිතෝෂික මුදල ගෙවීමට කටයුතු කිරීම

4) විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් අංකය ලැබී ඇති නිලධාරින්ට ඔවුන්ගේ පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා ඔබ ආයතනය සතුව ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ඇති විට අදාල පාරිතෝෂික මුදල ගෙවිය හැකිය. අනතුරුව මෙම දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුප් පාරිතෝෂික චෙක්පත ලැබුණු පසු එය පියවා ගන්නේ නම් මැනවි. මෙසේ, පාරිතෝෂික මුදල් ගෙවිය යුත්තේ නිලධාරියා විශ්‍රාම ගිය දිනය ඉක්මවා ඇත්නම් පමණි.

මෙම පාරිතෝෂික මුදල් ගෙවීමේ ප්‍රමාදයන් සිදුවීම අප දෙපාර්තමේන්තුවේ අඩුපාඩුවක් මත සිදු නොවන්නක් බව දන්වන අතර පාරිතෝෂික ගෙවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණවත් නොවීම නිසා සිදුවන්නක් බව වැඩිදුරටත් කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

**කේ. ඒ. තිලකරත්න**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය - (2007- 08- 08 දින නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් විසින් අයවැය අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් හා මාගේ සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවේදී ගත් තීරණ අනුව මින් ඉදිරියට අනුපිළිවෙල මත පාරිතෝෂික චෙක්පත් නිකුත් කෙරෙන බව කාරුණිකව දන්වමි.)

2. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ. ගැ.ස.
3. අයවැය අධ්‍යක්ෂ ජනරාල් - දැ. ගැ. ස. සහ අ. ක. ස.
4. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් - දැ. ගැ. ස. සහ අ. ක. ස.
5. විගණකාධිපති - දැ. ගැ. ස.